# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2370/15 - 2024 පෙබරවාරි මස 07 වැනි බදාදා - 2024.02.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය සහ 14 වන වගන්තිය සමග කියවිය යුතු, 20 වන වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මවිසින් සාදනු ලබන රෙගුලාසි.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික
ප්‍රතිපත්ති අමාත්‍ය.

2024 පෙබරවාරි මස 07 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

### රෙගුලාසි

1. මෙම රෙගුලාසි "**2024 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි**" ලෙස හඳුන්වනු ලැබේ.
2. 2023 ජනවාරි මස 01 දිනැති අංක 2312/78 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 2023 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවල අංක 12 (අ) රෙගුලාසිය,"2023 දෙසැම්බර් 31 දක්වා" යන්න අවලංගු කර ඒ සඳහා "2024 අගෝස්තු 31 දක්වා" යන්න ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කෙරේ.
3. මෙම රෙගුලාසිවල අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත, වාණිජ බැංකු වෙත සහ වෙනත් අදාළ ආයතන වෙත "මෙහෙයුම් උපදෙස්" නිකුත් කරනු ලැබිය යුතුය.
4. ඉහත රෙගුලාසිවලට අදාළව පැන නගින ඕනෑම කරුණක් සම්බන්ධයෙන් අවසාන තීරණය, ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් ලබා දෙනු ලැබේ.

EOG 02 - 0051

1A - PG 6640 — 406 (2024/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*